# සුළඟින් වැඩ ගන්නා

# සුළං මෝල



ජල සැපයුමට කරදර වියයුතු නෑ: සුළං මෝලෙන් පිළිතුරක්

**සුළං බල යන්ත්‍රය කොපමණ ජලය ලබා දෙන්නේ ද?**

**ජලය කොපමණ උසට පොම්ප කරන්නේ ද?**

මෙය සුළඟේ වේගය මත රඳා පවතී. උදහරණයක් වශයෙන් දිනකට සාමාන්‍යයෙන් තත්පරයට මීටර් 4 (පැයට සැතපුම්) නවයක වේගයෙන් හමන සුළඟට මෙම සුළං බල යන්ත්‍රය දිනකට වතුර ලීටර් 36,000—45'000 (ගැලුම් 8,000—10,000 ක්) දක්වා පොම්ප කරයි.

වඩා යහපත් සුළං වේග ඇති විට මීටර් 8 ක (අඩි 25 ක) ගැඹුරක සිට බිම් මට්ටම දක්වාත් එහි සිට මීටර් 5 ක් (අඩි 15 ක්) උසටත් ජලය ඔසවා දීමේ ශක්තියක් මෙම යන්ත්‍රයට ඇත.

**මෙම යන්ත්‍රය ක්‍රියා කරවීමට අවශ්‍ය සුළං බලය කොපමණ ද? අවශ්‍ය සුළං බල ප්‍රමාණය මෙරට සෑම පළාතකම පවතී ද?**

මෙම යන්ත්‍රය ක්‍රියා කරවීමට අවශ්‍ය සුළං බලය කොපමණ ද ? අවශ්‍ය යුළං බල ප්‍රමාණය මෙරට සෑම පළාතකම පවතීද ?

සුළං බල යන්ත්‍රයක් ක්‍රියාකර වීමට ත. මි. 3–5 (පැ. සැ. 7–10) වේගයක සුළඟක් අවශ්‍ය වෙයි. මෙවැනි සුළං යළ කන්නයේ දී (අප්‍රේල්–සැප්තැම්බර්) වියළි කලාපය පුරාම පවතී.

සුළං බල යන්ත්‍ර 64 ක් වියළි කලාපය තුළ දැනටමත් සාර්ථකව ක්‍රියාත්මක වෙයි.

**මෙම සුළං බල යන්ත්‍රය කුමන කටයුතු සඳහා උපයෝගී කර ගත හැකි ද.?**

(අ) කුඩා ප්‍රමාණයේ උස්සාන වාරිමාර්ග ක්‍රම හෙක්ටෙයාර් 0.4–0.8 (අක්කර 1–2) ප්‍රමාණයක ගොඩ ගොවිතැන් සඳහා.

(ආ) සත්ව ගොවිපලවල් සඳහා ජලය සැපයීම.

(ඇ) දිනකට වතුර ලීටර් 45,000 ( ගැලුම් 10,000 ) දක්වා අවශ්‍ය සුලු කර්මාන්ත සඳහා ජලය සැපයීම.

(ඇ) සෑහෙන පමණට ජලය ගබඩාකොට තැබීමේ හා පිරිසිදු කිරීමේ පහසුකම් ඇති තැන්වල ශෘහස්ථ ජල ජලසම්පාදනය.

(අ) සුළං බල යන්ත්‍රයක් සෑදීම සඳහා කොපමණ මුදලක් වැයවේ ද?

(ආ) එය මුදල් ගෙවා ලබා ගැනීමේ පහසුකම් තිබේ ද?

(ඇ) සුළං බල යන්ත්‍රය සඳහා ණය පහකම් ලබා ගත හැකි ද ?

[අ] දැනට පවත්නා මිළ ගණන් අනුව රු. 16,000/–, 20, 000/– අතර මුදලක් වියදම් කිරීමෙන් සාමාන්‍ය වැඩ පොළක දී තනා සවි කර ගත හැකි ය.

[ආ]සුළං බල යන්ත්‍ර ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගත හැකි වෙයි. ප්‍රවාහනය හා සවිකර දීම ඇතුළුව එක් යන්ත්‍රයක් සඳහා මණ්ඩලය අය කරනනේ රු. 12,500/-ක සහන මිළකි. සහන ආධාර රහිතව එහි මිළ රු. 12,500/- ක් වෙයි සහන මිළට සුළං බල යන්ත්‍ර මිළට ගත හැක්කේ පුද්ගල අයදුම්කරුවන්ට පමණී. රජයේ ආයතන සහ ව්‍යාපාර ස්ථානවලට මෙම සහනය නො ලැබේ.

[ඇ]මහජන බැංකුව හා ලංකා බැංකුව පහත සඳහන් දිස්ත්‍රික්ක 9 යේ ගොවින් සඳහා සුළං බල යන්ත්‍ර මිළ දී ගැනීමේ ණය පහසුකම් සළසා ඇත.

අනුරාධපුරය, යාපනය කුරුණෑගල, මාතලේ, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, පොළොන්නරුව වව්නියාව

**සුළං බල සන්ත්‍ර උපයෝගී කොට ගෙන ජලය ලබා ගත හැක්කේ කවර අන්දමේ ජලාශවලින්ද?**

නල ළිං, සාමාන්‍ය ළිං, ඇළ දෙළ හා ගංගාවල ජලය පොම්ප කිරීමට උපයෝගී කර ගත හැකිය.

**සුළං බල යන්ත්‍රය නඩත්තුකළ යුත්තේ කෙසේද?**

සුළං බල යන්ත්‍රයක ක්‍රියාකාරී කොටස් බොහෝ ඇත. ඒවා වරින් වර පරීක්ෂා කොට ග්‍රීස් හෝ තෙල් යෙදිය යුතුය. ජල පොම්පයට තෙල් දැමීම අවශ්‍ය නොවේ.

**භූමිතෙල් වලින් ක්‍රියා කරන වතුර පොම්පයක් වෙනුවට සුළං බල යන්ත්‍රයක් පාවිච්චි කිරීමේ ප්‍රයෝජන කවරේද ?**

අක්කර දෙකකඹඩමකට වතුර සපයන භූමිතෙල් පොම්පයකට එක යල් කන්නකට යන වියදම රු.3,500/- ක් පමණවේ. මෙම මහ කන්නය තුළ ද සෑහෙන වතුර ප්‍රමාණයක් සුළං බලයන්ත්‍රය පොම්ප කරයි. වියලි කලාපයට මහ කන්යේ දී වැසි ලැබෙන බවින් මෙම කාලය තුළ ජලය එසවීම එතරම් අවශ්‍ය නොවනු ඇත. නමුත් මෙම කාලයේදී ඔසවන ජලය වුවද, ප්‍රයෝජනවත් කටයුතු සඳහා යොදගත හැකිය. සුළං බල යන්ත්‍රය සඳහා මූලධන වියදම හැර වෙනත් වියදමක් අවශ්‍ය නැත.

සුළං බල යන්ත්‍රය ඉතා සරල නිමැවුමකි. එය සවිමත්ය. නඩත්තුව හා අළුත් වැඩියාව පහසුය.

**ඔබ දනට හඳුන්වා දෙන සුළං බල යන්ත්‍ර මාදිලිය විශේෂ නාමනම්, එය කුමක් ද ?**

එය ඩබලිව්. ටී. යූ. 1/3 යනුවෙන් හැඳින්වේ.

**ශ්‍රී ලංකාවේ ආදර්ශ සුළං බල යන්ත්‍රය ගොවිපොළක් තිබේද ?**

ජල සම්පත් මණ්ඩලයට අයත් ආදර්ශ සුළං බල යන්ත්‍ර ගොවිපළක් පුත්තලම-අනුරාධපුර පාරේ 52 වන සැතපුම් කණුව අසල ඇත. [අනුරාධපුර නගරයේ සිට කි. මී. 10 කි. ]

**සුළං බල යන්ත්‍ර භාවිතය පිළිබඳ උපදෙස් සහ වෙනත් විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.**

සුළං බල ඒකකය,
ජල සම්පත් මණ්ඩලය,
2 ඒ, ග්‍රෙගරි මාවත,
කොළඹ—7.

1982 ජුලි 02

**ජල සම්පත් මණ්ඩලය**
**2 ඒ, ග්‍රෙගරි මාවත,**
**කොළඹ -7.**

## අඩු වෙහෙසින් . . .

**එම වැටුනු කොළ මගින් පසට නයිට්‍රජන් සමග දෙනු ලබන අතරම පස ආවරණයද වන නිසා වල් පැලෑටි වලට වැඩීමට ඉඩක්ද නොලැබෙයි. මෙම කොළ හැලී ඉතිරි වන රිකිලි දර වශයෙන්ද යොදා ගත හැකිවේ.එමෙන්ම මෙසේ කොළ අතු හැලී යන විට එයින් ගිලිහෙන බීජ පසතුළට සිදුරුවී අවාරයේදී වේගයෙන් වැඩී පස ආවරණය කර වල් පැලෑටි වලට වැඩීමට බාධාකරනු ලබයි. හේන් ගොවිතැන් ක්‍රමයේදී ද බොහෝ විට වල් පැලෑටි මර්දනය කිරීම සඳහා යොදවනු ලබන්නේද ඉහතින් දක්වා ඇති මූලධර්මයයි. අනිත් අතට මෙසේ කොළ රොඩු ආවරණයක් මගින් පස ආවරණය කරන ලද භූමි වලින් ලබා ඇති අස්වැන්න එසේ නොකරන ලද භූමියකින් ලබන අස්වැන්නට වඩා වැඩි බව පර්යේෂකයින් විසින් පෙන්වා දී තිබේ.**

අවසාන වශයෙන් කිව හැක්කේ සී සෑමකින් තොරව වගා කිරීම නව සංකල්පයක් පමණක්ම නොව අඩු වියදමකින් ආහාර නිෂ්පාදනය වැඩිකිරීමේ ප්‍රයත්නයට නව එළියකි. කෙසේ වෙතත් මෙම නව ක්‍රමයන් ශ්‍රී ලංකාව තුළ වඩාත් දියුණු කළ හැකි ඉඩ ප්‍රස්තා ඉතාමත් වැඩි බව සඳහන් කළ හැකිය.